ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

සන්නිවේදන දෙපාර්තමේන්තුව
30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක: 2477424, 2477423, 2477311
ෆැක්ස්: 2346257, 2477739
ඊ-මේල්: dcommunications@cbsl.lk, communications@cbsl.lk
වෙබ් අඩවිය: www.cbsl.gov.lk

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2016 අගෝස්තු මස 11 වැනි දින |

## ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන ප්‍රකාශනය - 2016

ශ්‍රී ලංකා මහ බැංකුවේ, වාර්ෂික ප්‍රකාශනයක් වන "ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන - 2016" පොදු මහජන පරිශීලනය සඳහා දැන් නිකුත් කර ඇත. මෙම ප්‍රකාශනයෙහි දළ දේශීය නිෂ්පාදිතය, කෘෂිකර්මය, කර්මාන්ත, ජාත්‍යන්තර වෙළෙඳාම සහ මූල්‍ය කටයුතු, රාජ්‍ය මූල්‍ය, බැංකු සහ මූල්‍ය ආයතන, මූල්‍ය සහ ප්‍රාග්ධන වෙළෙඳපොළ, මිල හා වැටුප්, ශ්‍රම බලකාය, ප්‍රවාහනය, අධ්‍යාපනය, සෞඛ්‍ය සහ විදුලි සංදේශ සේවා, ජනගහනය සහ දේශගුණය යනාදී ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ තත්ත්වය පිළිබිඹු වන දර්ශක මෙන්ම අනෙකුත් රටවල්වල තෝරාගත් ආර්ථික සහ සමාජ දර්ශක ද ඇතුළත් වේ. ඊට අමතරව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද ආදායම් හා වියදම් පිළිබඳ සමීක්ෂණයෙන් සොයාගත් ශ්‍රී ලංකාවේ ජීවන තත්ත්වය, දරිද්‍රතාවය සහ කුටුම්බ ලක්ෂණවලට අදාළ තොරතුරු ද මෙහි ඇතුළත් කර ඇත. තවද, මූලික ආර්ථික විචල්‍යයන් පිළිබඳ

සවිස්තරාත්මක තොරතුරු ද පළාත් මට්ටමින් මෙම ප්‍රකාශනයෙහි ඇතුළත් වේ. දත්ත විශ්ලේෂණය කරන්නන්ගේ විවිධ අවශ්‍යතාවයන්ට ගැලපෙන අන්දමින් විවිධ අනුඛණ්ඩ යටතේ කාලශ්‍රේණි/හරස් අංශ දත්ත වශයෙන් මෙම ප්‍රකාශනයෙහි ඉදිරිපත් කර ඇත. ආර්ථිකයේ මෑතකාලීන ප්‍රවණතාවයන් හැදෑරීමට උපකාරීවන තොරතුරු රාශියක් මෙහි අඩංගු වී ඇති අතර, මෙම ප්‍රකාශනය ව්‍යවසායකයන්ට, ප්‍රතිපත්ති සම්පාදකයන්ට, පර්යේෂකයන්ට, ගුරුවරුන්ට, ශිෂ්‍යයන්ට සහ මහජනතාවට ඉතා ප්‍රයෝජනවත් වනු ඇත.

මෙම ප්‍රකාශනය වැතැම් වීදියේ "The Central Point" ගොඩනැගිල්ල, අංක 58, ශ්‍රී ජයවර්ධනපුර මාවතේ, බැංකු විදු පියෙස, ශ්‍රී ලංකා මහ බැංකුවේ මාතර, මාතලේ, නුවරඑළිය, යාපනය, කිලිනොච්චිය, ත්‍රිකුණාමලය සහ අනුරාධපුරයෙහි පිහිටි ප්‍රාදේශීය කාර්යාලවලින් සහ දිවයිනේ ප්‍රධාන පොත්හල්වලින් සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන භාෂා තුනෙන්ම මිල දී ගත හැකිය. එසේම ඉහත සඳහන් කරන ලද ස්ථානවලින් මෙම ප්‍රකාශනයෙහි විද්‍යුත් පිටපත් ඇතුළත් සංයුක්ත තැටි මිල දී ගත හැකිය. ඊට අමතරව, මෙම ප්‍රකාශනය ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවිය වන http:/www.cbsl.gov.lk යන අන්තර්ජාල සම්බන්ධතාවය ඔස්සේ භාෂා තුනෙන්ම ලබාගත හැක.